**යටිනුවර ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 15 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | --------------------------------- |
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි ඒකක 04 ක අගය රු.1,648,500 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |
| (ආ) | වටිනාකම රු.309,200 ක් වූ යන්ත්‍රෝපකරණ අයිතම 03 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |

#### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ---------------------------------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 02 ක ශේෂ හා උපයෝගී ලේඛන අතර රු.308,830 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | ඉදිරියේ දි වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කරමි. |

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | -------------- | --------------------------------- |
| (අ) | ලැබිය යුතු ගිණුම් | | |
| | අවුරුදු 05 ක් ඉක්මවා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂයන් හි එකතුව රු.2,436,390 ක් විය. | මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගයන් ගනිමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,720,914 ක් විය. | ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.9,723,640 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛන, ඔප්පු හා උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.5 අනුකූල නොවීම**

**1.3.5.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | 218 වගන්තිය | සියලුම ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ රීති පරිදි කටයුතු කළ යුතුවේ. | වර්තමානය වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 371(2)(ඇ) | වටිනාකම රු.604,386 ක් වූ තත්ත්කාර්යය අතුරු අග්‍රිම 50 ක් දින 08 සිට දින 158 ක් දක්වා කාලයක් නොපියවා අත රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අදාළ කාර්යයන් නිම වූ වහාම අග්‍රිම පියවන ලෙස දැනුවත් කර ඇත. |
| (ii) | මු.රෙ. 570 | වටිනාකම රු.4,351,311 ක් වූ කල් ඉකුත් වූ තැන්පත් නිදහස් කිරීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අදාළ මුදල් රෙගුලාසි අනුව ක්‍රියාමාර්ග ගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මු.රෙ. 571 හි (03) වගන්තිය | රු.2,195,006 ක් වූ තාවකාලිකව තබා ගත යුතු තැන්පත් වර්ෂ 01 සිට 05 දක්වා දීර්ඝ කාලයක් දක්වා රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී තැන්පත් නිදහස් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වෙනත් චක්‍රලේඛ<br>----------------------<br>1996 අගෝස්තු 06 වන දින අංක 935/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලිවල 22(1) නියෝගය | අතුරු බෙදීමෙන් පසු හිමි වූ ඉඩම් කට්ටි 04 ක් අදාළ අරමුණු වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | ඉදිරියේ දී සංවර්ධන කටයුතු සඳහා යොදා ගනිමි. |

**1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිවාඩු දින වැටුප් ගෙවීම<br>-----------------------------<br>මප/ප.පා.කො/චක්‍රලේඛ අංක 2018/08 ප්‍රකාර, පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සහ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10.1(අ) අනුව, පැය 08 ක සේවා කාලය නිශ්චිතව තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.116,343 ක් නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණි. | නිවාඩු දින වැටුප් ගෙවීමේ දී අදාළ චක්‍රලේඛ, රෙගුලාසි අනුගමනය කළ යුතු වේ. | පළාත් පාලනවල නිල කාලය අවසන් බැවින්, ආයතන ප්‍රධානියා ලෙස සභාපතිගේ අනුමැතිය යටතේ ගෙවීම් සිදු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,179,167 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,551,386 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,469,560 | 3,666,679 | 3,149,162 | 3,383,477 | 3,469,560 | 3,461,239 | 3,063,107 | 2,944,787 |
| (ii) | කුලී | 298,000 | 339,228 | 328,228 | 11,000 | 250,000 | 201,665 | 201,665 | -- |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,650,000 | 2,144,802 | 2,144,802 | -- | 1,400,000 | 1,558,800 | 1,558,800 | 11,145 |
| (iv) | වෙනත් ආදායම් | 53,191,000 | 51,760,255 | 78,340,965 | 82,025,600 | 46,450,000 | 38,038,405 | 9,694,359 | 94,478,179 |
| | එකතුව | 59,608,560 | 57,910,964 | 83,963,157 | 85,420,077 | 51,569,560 | 43,290,109 | 14,517,991 | 97,434,111 |

**2.2.2** <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම්<br>-----------<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.2,814,428 ක වරිපනම් බදු ශේෂයක් අය විය යුතුව පැවතුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරමි. |

**2.2.3** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.286,361 ක් හා මුද්දර ගාස්තු රු.16,709,508 ක් විය. | ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අය කිරීම් සඳහා කටයුතු කරමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී, මහජන අවශ්‍යතාවයන් අනුව, ඉටු කිරීමට අනුමත කර තිබූ රු.14,306,000 ක වටිනාකමින්යුත් කර්මාන්ත 92 න් වටිනාකම රු.8,831,000 ක් වූ කර්මාන්ත 58 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අනුමත කර ගත් කර්මාන්ත ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1992 පෙබරවාරි 26 දිනැති නාගරික සංවර්ධන අධිකාරී අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 05/01/119 වෙළුම ix හි (1) වගන්තිය ප්‍රකාර, සැලසුම් කමිටු දීමනා ගෙවීමේ දී, කාර්යාල වේලාවෙන් බැහැරව පැය 02 කට වැඩි කාලයක් ආවරණය කළ යුතු වුව ද, එම කාලය ලිඛිතව සනාථ කර නොගෙන සමාලෝචිත වර්ෂය තුළ දී, රු.81,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | අදාළ දීමනා ගෙවීමට පෙර චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල ද, යන්න පරීක්ෂා කළ යුතුවේ. | පැමිණීමේ ලේඛනය, බැහැර ලේඛනය, ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම, පිටවීම තහවුරු කර ගත් බවත්, ඉදිරියේ දී ඇඟිලි සලකුණු යන්ත්‍රය පමණක් යොදා ගන්නා බවත් දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 14 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුවේ. | ඉදිරියේ දී, බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 හා 2019 වර්ෂවල ලද අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි 179 ක් අතුරින් පැමිණිලි 48 ක් සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලිවලට අදාළ ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. | වැඩි පැමිණිලි ප්‍රමාණයක් තැපැල් හා දුරකථන මඟින් ලැබෙන අතර, තොරතුරු නොමැතිවීම මත කටයුතු කළ නොහැකි බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු ළිං 07 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණි. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසා ඇති අතර, ලැබෙන උපදෙස් මත ඉදිරියේ දී කටයුතු කරමි. |

### 3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.14,690,122 ක් වූ වාහන 07 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම් මඟින් උපරිම ප්‍රයෝජන ගත යුතුවේ. | රියැදුරන් නොමැතිවීම මත වාහන ඉවත් කර තබා ඇත. |
| (ආ) | වටිනාකම රු.802,000 ක් වූ අංක තහඩු හඳුනාගත නොහැකි ට්‍රේලර් 05 ක් වැඩ ඒකකය තුළ වසර 10 ක කාලයක් දිරාපත්වීමට ඉඩ හැර තිබුණි. | භාවිතා කළ නොහැකි වත්කම් හඳුනා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේ දී වෙන්දේසි කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සියඹලාගොඩ වැඩ ඒකකය පවතින භූමියේ ඇති ගොඩනැගිල්ල අලුත්වැඩියාවකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම් නඩත්තු කිරීම සිදු කළ යුතුවේ. | ඉදිරියේ දී අලුත්වැඩියා කර භාවිතා කරමි. |

### 3.6 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 වගන්තිය ප්‍රකාරව, වාහන කීපයක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛයන් පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂණයක් සිදු කරමි. |
| (ආ) | රු.1,275,000 ක් වටිනා වාහන 02 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාහන නිෂ්කාර්යයව පවතින බැවින්, බලපත්‍ර ලබා ගැනීමට කටයුතු නොකළ බව දන්වමි. |

### 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 – 3.5 | | |
| අංක 252 – 6349 කැබ් රථයේ එංජිම වෙනස් වීමට අදාළ කරුණු පරීක්ෂා කර ඒ සඳහා වූ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරීක්ෂා කර අදාළ ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් පරීක්ෂණයක් සිදු කර ඇති අතර, වාර්තා ලද පසු කටයුතු කරන බව දන්වමි. |